# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2142/88 – 2019 සැප්තැම්බර් 27 වැනි සිකුරාදා – 2019.09.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/225.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

එච්. එස්. එල්. පෙරේරා මයා., අංක 219 ඩී, හබරලගහලන්ද පාර, මොල්ලිගොඩ, වාද්දුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

බාටා ෂූ කම්පැනි ඔෆ් සිලෝන් ලිමිටඩ්, අංක 100, ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල පාර, රත්මලාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1, පී. නවරත්න මයා. පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.


1A – G 31133 – 16 (2019/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/05/2018/225.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

එච්. එස්. එල්. පෙරේරා මයා., අංක 219 ඩී, හබරලගහලන්ද පාර, මොල්ලිගොඩ, වාද්දුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

බාටා ෂූ කම්පැනි ඔෆ් සිලෝන් ලිමිටඩ්, අංක 100, ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල පාර, රත්මලාන.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''බාටා ෂූ කම්පැනි ඔෆ් සිලෝන් ලිමිටඩ් හි සේවය කරන එච්. එස්. එල්. පෙරේරා මහතාව 2004.02.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැනිපියුලන්ට් තනතුරේ ස්ථිර කළ පසු,

01. අඩු වැටුපක් ලබාදීම.
02. මාසික වැටුප අඩු කිරීම.
03. වැටුප් පරිමාණය වැඩි නොකිරීම.

යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද?'' යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 – 487

---

මගේ අංකය: IR/COM/05/2018/270.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා කාර්මික නිලධාරීන්ගේ සංගමය, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, කොළඹ 07.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතර, පඹුරණ, අබේගුණරත්න මාවත, අංක 10/ඒ, ඒ. ඒ. වීරසූරි මයා. පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2018/270.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා කාර්මික නිලධාරීන්ගේ සංගමය, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, කොළඹ 07.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 2018 වර්ෂයේ සංශෝධනය කිරීමේදී, JM 1-1 වැටුප් කේතයේ සිටි ඇතැම් තනතුරු MM 1-1 වැටුප් කේතයේ පිහිටවුව ද, ඒ වනවිට JM 1-1 සමාන වැටුප් කේතයේ සිටි 1 ශ්‍රේණියේ කාර්මික සහකාරවරුන්ට (කාර්යභාර නිලධාරීන් ද ඇතුළුව) MM 1-1 වැටුප් තලය (දරන්නන්ට පමණක් පුද්ගලික වන සේ හෝ) ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහන කවරේ ද?'' යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 26 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 – 488

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.